Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සති පාසල

සතිය- 06

විෂය- පෙරදිග සංගීතය

12 ශ්‍රේණිය

සැකසුම-එම්.ඩී.එල්.පී.වික්‍රමසිංහ
රත්නපුර අධ්‍යාපන කලාපය-සෞන්දර්ය අංශය

**නිපුණතාව-1.0 නිපුණතා මට්ටම-1.4 පාඩම- ගති මිති ලය සංකල්ප හා උත්තර භාරතීය තාල**

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01. ත්‍රිතාල්, ඣප් , දීප්චන්දි, දාදරා, යන තාල රූප හතරම නිර්මාණය සඳහා අවශ්‍ය මූලික **ධ්වනි** ගණන,

1) හතරකි 2) පහකි 3) හයකි 4) හතකි 5) අටකි

02. පහත දැක්වෙන තාල අතරින් **කුලා** අක්ෂර කිසිවක් නොයෙදෙන එක් විභාගයක් සහිත තාලය වන්නේ කුමක් ද?

1) දාදරා 2) ලාවණී 3) කෙහෙර්වා 4) ඣප් 5) ත්‍රිතාල්

03. යම් තාල පද දෙකක් එකම ලයකින් එකවර ආරම්භ වී එක් තාලයක් ආවර්ත තුනක් ගිය විට ද අනෙක් තාලය ආවර්ත පහක් ගිය විට ද නැවත තාල දෙකෙහි සමස්ථානයන් එකට හමුවේ. එම තාල දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) ත්‍රිතාල්-ඣප් 2) කෙහෙර්වා-දීප්චන්දි 3) දීප්චන්දි-දාදරා 4) ඣප්-දාදරා 5) ත්‍රිතාල්-ලාවණී

04. පහත දැක්වෙන තාල අතරින් අතිවිලම්භ,විලම්භ,මධ්‍ය,දෘත යන සියලු ලයවල දී භාවිතවන තාලපදය කුමක් ද ?

1) දාදරා 2) කෙහෙර්වා 3) ඣප් 4) දීප්චන්දි 5) ත්‍රිතාල්

05. මිති ලක්ෂණයෙන් සමාන තාලපද යුගළයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) ලාවණී-කෙහෙර්වා 2) ඣප්-දාදරා 3) ත්‍රිතාල්-දීප්චන්දි 4) ලාවණී-දාදරා 5) ඣප්-කෙහෙර්වා

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06. ත්‍රිතාලයේ හතරවන මාත්‍රාවත් දොළොස්වන මාත්‍රාවත් ඉවත් කළ විට ජාති ලක්ෂණ මතුවන්නේ කිනම් තාලයක ද ?

07. ධා, තිං, ධිං, තා යන අක්ෂර හතර පමණක් උපයෝගී කරගෙන නිර්මාණය කළ හැකි තාල රූප නම් කරන්න.

08. දාදරා සහ කෙහෙර්වා තාල දෙක අතර දැකිය හැකි සමානතා දෙකක් හා අසමානතා දෙකක් නම් කරන්න.

09. ධනිසමගු, මධනිස, නිධ, මපධගුරිස යන බාගේශ්‍රි රාගාශ්‍රිත ස්වර සංගති පිළිවෙළින් යොදා ගනිමින් ඣප් තාලයේ ආවර්ත දෙකකට ගැළපෙන සේ තනුවක් නිර්මාණය කරන්න.

10. ඉහත ප්‍රශ්නයේ දැක්වූ ස්වර පාදය ස්වර පිළිවෙළ වෙනස් නොවන සේ දීප්චන්දි තාලයේ එක් ආවර්තයකට ගළපා ප්‍රස්තාර කරන්න.

## දෙවන කොටස

01. "තාල"යන්නට නිර්වචනයක් සපයා සංගීතයේ දී තාලයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

02. තාලයක ගති, මිති, ලය යන සංකල්ප කෙටියෙන් හඳුන්වන්න.

03. තාලයක අනන්‍ය වූ ගති ලක්ෂණ කෙරෙහි බලපාන සාධක පහක් ලියන්න.

04. ත්‍රිතාල්, ඣප්, දීප්චන්දි, දාදරා, යන තාල සමගුණ හා දෙගුණ වශයෙන් ප්‍රස්තාර කර දක්වන්න.